# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


මගේ අංකය / எனது இல / My Ref. } CSS/7/1/9 | ඔබේ අංකය / உனது இல / Your Ref. } | දිනය / திகதி / Date } 2018.09 04

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03-2018**

දකුණු පළාත් සභාවේ සියළුම
අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ව්‍යවස්ථාපිත අධිකාරී ප්‍රධානීන්
හා ආයතන ප්‍රධානීන් වෙත.

**<u>රාජ්‍ය අංශයේ ආයතනවලට කාර්යමණ්ඩල බඳවා ගැනීම් හා වැටුප් හා දීමනා ගෙවීම් සම්බන්ධයෙනි</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ ලේකම් විසින් නිකුත් කර ඇති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2018 හා 2018.07.18 දිනැති ලිපිය හා බැඳේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත.)

**02.** එමගින් රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩල පිළිබඳ 2018 වර්ෂයේ පළමුවන කාර්තුවේ වාර්තාව යන මැයෙන් ගරු මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සටහන සම්බන්ධයෙන් 2018.06.19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කිරීමෙන් අනතුරුව පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස උපදෙස් දී ඇති බව දැනුම් දී ඇත.

(1) සියලුම අමාත්‍යාංශ හා ඒවායේ විෂය පථය යටතට ගැනෙන ආයතනවල පහත (අ) හා (ආ) හි සඳහන් පරිදි කටයුතු කර ඇති අවස්ථා පවතී නම්, සලකා බැලීම පිණිස, ඒ පිළිබඳ තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කළ යුතු වේ.

(අ) පළාත් සභා ඇතුළු රාජ්‍ය ආයතන විසින් එම ආයතන වල අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා විවිධ සේවා කාණ්ඩ යටතේ බඳවාගෙන ඇති සේවක සංඛ්‍යා පිළිබඳ විස්තර;

(ආ) ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ හා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව, සිය ආයතනවල සේවකයින් වෙත ගෙවනු ලබන වැටුප් හා දීමනා වැඩි කිරීම් පිළිබඳ විස්තර;

(11) ඉදිරියේදී, මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව, සිය ආයතනවලට කාර්ය මණ්ඩල බඳවා ගැනීම් හා සිය ආයතනවල


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office } 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax } 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail } chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site } www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල    Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle

කාර්ය මණ්ඩල වෙත ගෙවනු ලබන වැටුප් හා දීමනා තීරණය කිරීමෙන් වැළකිය යුතු වන අතර එකී උපදෙස් වලට අනුගතව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවන්හිදී ඒ සම්බන්ධයෙන් වන වගකීම අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා/ පළාත් ප්‍රධාන ලේකම්වරයා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා/අදාළ ආයතන ප්‍රධානියා හා මූල්‍ය අංශයේ ප්‍රධානියා විසින් දැරිය යුතු වේ.

**03.** ඒ අනුව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2018 හි සඳහන් මෙම උපදෙස් අනුව කටයුතු නොකිරීම නිසා ඇතිවන තත්ත්වයන්ට වන වගකීම සෘජුවම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ව්‍යවස්ථාපිත අධිකාරී වල ප්‍රධානීන්, අදාළ ආයතන ප්‍රධානීන් හා මූල්‍ය අංශ ප්‍රධානීන් විසින් දැරිය යුතු බවට කාරුණිකව දැනුම් දෙන අතර, තම ආයතනවලට කාර්යමණ්ඩල බඳවා ගැනීමේදී හා වැටුප් හා දීමනා ගෙවීමේදී විශේෂ අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

**04.** තවද පළාත් සභාවට අයත් සමහර ව්‍යවස්ථාපිත අධිකාරී ආයතනවල අතිරික්ත කාර්ය මණ්ඩල පැවතීම හා වැටුප් හා දීමනා ගෙවීමෙ විෂමතාවයන් පිළිබඳව විගණන ජේදවලටද ලක්ව ඇති බැවින් ව්‍යවස්ථාපිත අධිකාරී ආයතන වලට කාර්ය මණ්ඩල බඳවා ගැනීමේදී හා කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ගෙවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින ලෙස අවධාරණය කරමි. (ව්‍යවස්ථාපිත අධිකාරී හා කාර්යාංශවල අනුමත කාර්ය මණ්ඩලය ලෙස අදහස් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය වේ.)

**05.**ඔබ ආයතන වල ඉහත 2 ජේදයේ (1) (අ) සහ (ආ) හි සඳහන් තත්ත්වයන් පවතී නම් එම විස්තර නොපමාව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු )වෙත වාර්තා කරන ලෙස වැඩිදුරටත් දැනුම් දෙමි.

**06.**මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලු ආයතන දැනුවත් කරන ලෙසද දන්වා සිටිමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

| | | |
|---|---|---|
| පිටපත් | 01. ලේකම්, මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශය | : දැ.ගැ.ස. |
| | 02. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු ) | : චක්‍රලේඛයේ උපදෙස් දී ඇති පරිදි පළාත් සභාවේ සියළු ආයතන වලින් තොරතුරු ලබාගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට නොපමාව ඉදිරිපත් කිරීමට |
| | 03. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) | : දැ.ගැ.ස. |
| | 04. සහකාර විගණකාධිපති, දකුණු පළාත | : දැ.ගැ.ස. |
| | 05.අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව | : අ.ක.ස. |

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2018.07.18

කළමනාකරණ සේවා චක්‍රලේඛ: 03/2018

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ

සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල ප්‍රධානීන් වෙත,

**<u>රාජ්‍ය අංශයේ ආයතනවලට කාර්යමණ්ඩල බඳවා ගැනීම් හා වැටුප් හා දීමනා ගෙවීම් සම්බන්ධයෙනි</u>**

රාජ්‍ය අංශයේ කාර්යමණ්ඩල පිළිබඳ 2018 වර්ෂයේ පළමුවන කාර්තුවේ වාර්තාව යන මැයෙන් ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සටහන සම්බන්ධයෙන් 2018.06.19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී සාකච්ඡා කිරීමෙන් අනතුරුව පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත.

(I). සියලුම අමාත්‍යාංශ හා ඒවායේ විෂය පථය යටතට ගැනෙන ආයතනවල පහත (අ) හා (ආ) හි සඳහන් පරිදි කටයුතු කර ඇති අවස්ථා පවතී නම්, සලකා බැලීම පිණිස, ඒ පිළිබඳ තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කළයුතු වේ.

(අ). පළාත් සභා ඇතුළු රාජ්‍ය ආයතන විසින් එම ආයතනවල අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා විවිධ සේවා කාණ්ඩ යටතේ බඳවාගෙන ඇති සේවක සංඛ්‍යා පිළිබඳ විස්තර;

(ආ). ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ හා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව, සිය ආයතනවල සේවකයින් වෙත ගෙවනු ලබන වැටුප් හා දීමනා වැඩි කිරීම් පිළිබඳ විස්තර;

(II). ඉදිරියේදී, මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව, සිය ආයතනවලට කාර්යමණ්ඩල බඳවා ගැනීම් හා සිය ආයතනවල කාර්යමණ්ඩල වෙත ගෙවනු ලබන වැටුප් හා දීමනා තීරණය කිරීමෙන් වැළකිය යුතු වන අතර එකී උපදෙස්වලට අනුගතව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවන්හිදී ඒ සම්බන්ධයෙන් වන වගකීම අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා/ පළාත් ප්‍රධාන ලේකම්වරයා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා/ අදාළ ආයතනයේ ප්‍රධානියා හා මූල්‍ය අංශයේ ප්‍රධානියා විසින් දැරිය යුතු වේ.

**ආර්.එච්.එස්. සමරතුංග**

භාණ්ඩාගාරයේ ලේකම් සහ

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

පිටපත්:

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය
04. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව
05. ලේකම්, මුදල් කොමිෂන් සභාව
06. සභාපති, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
07. විගණකාධිපති